**සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ (අතිරේක මූල්‍යකරණ) ව්‍යාපෘතිය - 2021**

-----------------------------------------------------------------------------------

සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ (අතිරේක මූල්‍යකරණ) ව්‍යාපෘතියේ 2021 නොවැම්බර් 17 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2021 ඔක්තෝබර් 07 දිනැතිව ඇති කර ගත් අනුපිළිවෙළින් අංක L4121 - SRI සහ අංක G9222 - SRI දරන ණය සහ ප්‍රදාන ගිවිසුම්වල විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------

ණය සහ ප්‍රදාන ගිවිසුම් ප්‍රකාරව, සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය වන අතර මධ්‍යම, උතුරු මැද, සබරගමුව සහ ඌව පළාත් සභා හතර ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ මුල් ව්‍යාපෘතියේ මුල් විෂය පථය ක්‍රියාවට නැංවීම සඳහා ඉහත සඳහන් කර ඇති නැවත වෙන්කිරීම් හේතුවෙන් ඇති වන අරමුදල් හිඟය පියවීම, COVID - 19 වසංගතයේ මේ වන විට පවතින තුන්වන රැල්ල කළමනාකරණය කිරීම හේතුවෙන් තවදුරටත් වැඩි වෙමින් පවතින ඉල්ලුම සපුරාලීම, ඉහළ ගුණාත්මකභාවයෙන් යුත් පොකුරු රෝහල් වශයෙන් සංවර්ධනය කෙරෙන මුල් ව්‍යාපෘතියේ දිස්ත්‍රික්ක නවයට අයත් එක් එක් දිස්ත්‍රික්කය තුළ අවම වශයෙන් එක් ද්විතීයික සත්කාරක පහසුකමක් (COVID-19 සිද්ධි කළමනාකරණය ඇතුළුව) සංවර්ධනය කිරීම සඳහා සහාය ලබා දීම, දිවයිනේ ඉහළ යන COVID-19 තත්ත්වය සැලකිල්ලට ගෙන දුරස්ථ සහ විද්‍යුත් ඉගෙනුම් සඳහා ලබා ගත හැකි පහසුකම් පුළුල් කිරීම, ව්‍යාපෘතියේ අවසන් දිනය මාස 24කින් හෝ 2025 නොවැම්බර් දක්වා දීර්ඝ කර, පුළුල් කරන ලද ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කර, ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සහ COVID-19 ආශ්‍රිත මූල්‍යකරණ පරතර සපුරාලීම සඳහා දරිද්‍රතාව අවම කිරීම සඳහා වන ජපාන අරමුදලින් එ.ජ.ඩො. මිලියන 3 ක ප්‍රදානයක් ලබා ගැනීම සඳහා ප්‍රවේශ වීමයි. මෙම ණය සහ ප්‍රදාන ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 24,538.5 කට සමාන එ.ජ.ඩො. මිලියන 123කි. එයින් රු. මිලියන 22,543.5 කට සමාන එ.ජ.ඩො. මිලියන 113 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ඉතිරි මුදල වන රු. මිලියන 1,995.0 ක් මූල්‍යකරණය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2021 නොවැම්බර් 17 වන දින ආරම්භ කරන ලද අතර 2025 නොවැම්බර් **30** දින වන විට එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිතව තිබේ.

## 1.3 මතය

------

2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| | රු. මිලියන 2,328 ක වියදමින් වෛද්‍ය උපකරණ වර්ග 19 ක අයිතම 4,400 ක් මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන් වෙත කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) | මෙම ප්‍රසම්පාදන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.10.1 (ඇ), 2.11.2, 2.12 (අ) සහ 8.9.1, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතේ 6 (i) (අ) උප වගන්තියේ විධිවිධානවලට සහ ලංසු තැබීමේ කොන්දේසි අංක 35.41 (ඊ), 35.41 (ඌ) සහ 35.41 (ඇ) පටහැනිව සිදු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එම ප්‍රසම්පාදනවල විනිවිදභාවය සහ විධිමත්භාවය ආරක්ෂා වී නොතිබුණි. | මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දෙවන ඡේදයට අනුව මෙම ප්‍රසම්පාදන සියල්ල සිදු කර ඇති බව. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නීති සහ රෙගුලාසිවලට අනුකූලව සිදු කළ යුතුය. |
| (ආ) | අවශ්‍යතාවය නිසි ලෙස හඳුනාගෙන ප්‍රසම්පාදනය සැලසුම් කර නොතිබීම හේතුවෙන් 2022 අප්‍රේල් 27 දින වන විටත් වෛද්‍ය උපකරණ වර්ග 15 කට අයත් අයිතම 1,546 ක් ගබඩාවේ ඉතිරිව පැවතුණි. එසේම, හදිසි අවශ්‍යතාවයක් පවතින බව සහ අමතර තොග පවත්වා ගෙන යනු ලබන, දැනට ලියාපදිංචි වී සිටින සැපයුම්කරුවන්ගෙන් පමණක් ලංසු කැඳවන බව සඳහන් කිරීමෙන් ලංසු ඉදිරිපත් කිරීමේ හැකියාව සීමා කර තිබුණි. කෙසේ වුවද, වෛද්‍ය උපකරණ අයිතම 1,546 ක් ගබඩාවේ ඉතිරිව පැවතීම හේතුවෙන් එවැනි හදිසි අවශ්‍යතාවයක් පැවති බව තහවුරු නොවීය | නිවැරදි උපකරණ සංඛ්‍යාව පිළිබඳව පුරෝකථනය කළ නොහැක, සියලුම රෝහල් සහ ICC මධ්‍යස්ථාන සඳහා උපකරණවලින් බහුතරයක් බෙදා හැරීමෙන් පසුව, ඉතිරි උපකරණ ප්‍රමාණය තවමත් ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා ඒකකයේ ගබඩාවල ඉතිරිව පවතින අතර රෝහල්වල අනාගත උපකරණ අවශ්‍යතාවය සපුරාලීම සඳහා එම උපකරණ බෙදා හරින බව. | හදිසි අවශ්‍යතා සහ ප්‍රසම්පාදන ක්‍රමය නිවැරදිව හඳුනාගත යුතු අතර ඒ අනුව උපකරණ මිලදී ගත යුතුය. |
| (ඇ) | වෛද්‍ය උපකරණ වර්ග 11 කට අයත් අයිතම 1,725 ක් මිලදී ගැනීමේදී, ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර තිබුණු සම්මත පිරිවිතර සංශෝධනය කර තිබුණු අතර එසේ සිදුකිරීමට පිළිගත හැකි සාධාරණ හේතු සහ ලබා ගන්නා ලද අනුමැතීන් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. ඩිෆිබ්‍රිලේටර් 50 ක් මිලදී ගැනීමේදී, එක් පිරිවිතරයක් එක් ලංසුකරුවෙකුට පමණක් සපුරාලිය හැකි වන පරිදි පක්ෂග්‍රාහී ලෙස සංශෝධනය කිරීම හේතුවෙන්, අනෙකුත් සියලුම පිරිවිතර සහ අවශ්‍යතා සපුරා තිබුණු අවම ලංසුකරුට | ලංසු ලේඛනයේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූල විය හැකි ලංසුකරුවන් සිටින නමුත් ඔවුන් මෙම ප්‍රසම්පාදනය සඳහා සහභාගී වී නොමැති බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයකින් යුතුව සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත්තුව පිරි නැමීමට නොහැකි වීම හේතුවෙන් සිදුවී තිබුණු පාඩුව රු. මිලියන 37 ක් විය. | | |
| (ඇ) | හදිසි අවශ්‍යතාවය සඳහා අතැති තොග පවත්වාගෙන යන ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් පමණක්, වෙළෙඳපොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරමින් ලංසු කැඳවා, ඩිෆිබ්‍රිලේටර් 50 ක්, අතේ ගෙන යා හැකි එක්ස්රේ යන්ත්‍ර 35 ක්, චූෂණ උපකරණ 135 ක්, අධි ප්‍රවාහ නාසික ඔක්සිජන් යන්ත්‍ර 325ක් සහ සංවාතක (නවජ) 10 ක් මිලදී ගැනීම සඳහා සිදු කළ ප්‍රසම්පාදනවල දී, තොග පවතින බව හෝ බෙදාහැරීමේ කාල සටහනක් ඉදිරිපත් කර ඒ අනුව සැපයිය හැකි බව වැනි සාවද්‍ය තොරතුරු ලබා දෙමින් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර සැලකිය යුතු ප්‍රමාදයන් සහිතව භාණ්ඩ සපයා තිබුණි. | මෙම කාලසීමාව තුළ වෛද්‍ය උපකරණ සඳහා පැවති ඉහළ ඉල්ලුම හේතුවෙන් පෞද්ගලික පරිත්‍යාගශීලීන් විසින් මෙම තොග සැපයුම්කරුවන්ගෙන් මිලදී ගෙන සෞඛ්‍ය පද්ධතියට පරිත්‍යාග කර තිබුණි. එබැවින්, සැපයුම්කරුවන් සතුව අතැති තොග නොතිබුණ බව. | සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන ලද සැපයුම්කරුවන්ට එරෙහිව කටයුතු කළ යුතුය. |
| (ඉ) | අතේ ගෙන යා හැකි එක්ස් කිරණ යන්ත්‍ර 35ක් සැපයීමට ලංසු ඉදිරිපත් කළ ලංසුකරුවන් අතරින් සුදුසුකම් ලත් හා සිව්වැනි අවම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුට යන්ත්‍ර 20ක් පමණක් සැපයීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර අටවැනි අවම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුට යන්ත්‍ර 15ක් සඳහා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. යන්ත්‍ර 15ක් සැපයීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද සැපයුම්කරු විසින් ඇණවුම ලද වහාම යන්ත්‍ර 05ක් සහ සති 02ක් ඇතුළත යන්ත්‍ර 10ක් සපයන බවට එකඟවී තිබුණු නමුත් දින 70ක ප්‍රමාදයකින් පසුව යන්ත්‍ර සපයා තිබුණි. එවැනි සාවද්‍ය තොරතුරු මත පදනම්ව එම සැපයුම්කරු තෝරා ගෙන තිබීම හේතුවෙන් හා යන්ත්‍ර 20ක කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ සුදුසුකම් ලත් අවම ලංසුකරු වෙත යන්ත්‍ර 35ක කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබීම හේතුවෙන් සිදුවී තිබුණු පාඩුව රු.මිලියන 37.7 ක් විය. සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරමින් උපකරණ සැපයීම ප්‍රමාද කර තිබුණු සැපයුම්කරුගෙන් මිලියන 4.4 ක දඩ මුදලක් පමණක් අයකර තිබුණි. | ලංසු ලේඛනයේ කොන්දේසි අනුව දඩ මුදල් අඩු කර ඇති බව. | සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කළ සැපයුම්කරුගෙන් සම්පූර්ණ අලාභය අයකරගත යුතුය. |

**2.2 ඌන උපයෝජිත සම්පත්**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මහ බැංකු ප්‍රකාශනවලට අනුව, ව්‍යාපෘතිය සඳහා 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2,434.46 කට සමාන එ.ජ.ඩො. මිලියන 12.06 ක් මූල්‍යනය කර තිබුණි. කෙසේ වුවද, මෙම මුදලින් රු. මිලියන 1,996.37කට සමාන එ.ජ.ඩො. මිලියන 9.93 ක් පමණක් ව්‍යාපෘතිය සඳහා උපයෝජනය කර තිබුණි. ඒ අනුව, සියයට 17.99 ක ප්‍රතිශතයක් නියෝජනය කරන රු.මිලියන 438.09 කට සමාන එ.ජ.ඩො. මිලියන 2.13 ක මුදලක් ව්‍යාපෘතිය සඳහා උපයෝජනය කර නොතිබුණි. | ව්‍යාපෘතිය 2021ඔක්තෝබර් 17 දින සිට ක්‍රියාත්මක වූ අතර බලාත්මක වන දිනට පූර්වයෙන් වූ මාස 12 ක කාලයක් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් වෛද්‍ය උපකරණ ලබා ගැනීම සඳහා දරන ලද වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා අරමුදල් වෙන් කරන ලදී. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා ඒකකය මගින් ලබා දී ඇති ප්‍රසම්පාදන ලැයිස්තුවට අනුව, රු. මිලියන 2,434.46 ක මුළු මුදලක් මූල්‍යකරණය කළ බව, කෙසේ වුවද, ගෙවීම් මුදා හැරීමට සිදු වූ විට, ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් ඉදිරිපත් කරන ලද ඇතැම් ලේඛන, ගෙවීම් සිදු කිරීම සඳහා යෝග්‍ය මට්ටමක නොතිබුණු බව. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා සැලසුම් කළ මූල්‍ය කාර්යසාධනය එ.ජ.ඩො. මිලියන 13.88 කි. කෙසේ වුවද, තථ්‍ය මූල්‍ය කාර්යසාධනය එ.ජ.ඩො. මිලියන 9.93 ක් පමණක් වූ අතර එය සියයට 71.54 කට සමාන විය. | මෙම ප්‍රසම්පාදන කටයුතු ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා ඒකකය මගින් සිදු කර ඇති අතර අදාළ පාර්ශවවලින් පැහැදිලි කිරීම් ලබාගෙන ප්‍රතිපූරණය සඳහා අවසාන අනුමැතිය ලබා දීමට ආධාරකරුට සැලකිය යුතු කාලයක් ගත වී තිබුණු බව හා ඒ අනුව, තථ්‍ය මූල්‍ය කාර්යසාධනය එ.ජ.ඩො. මිලියන 9.93 ක් වූ අතර එය සියයට 71.54 කට සමාන බව. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. |